Sri Lanka Book Awards

# ස්වර්ණ  පුස්තක සම්මානය/ රජත පුස්තක 2026

# අයදුම් පත්‍රය

*(අදාල සම්මාන අංශය වෙනුවෙන් අයදුම්පත් වෙන වෙනම පිරවිය යුතුය. අනවශ්‍ය වචන කපා හරින්න.)*

අයදුම් කරන සම්මාන අංශය  : **ස්වරණ පුස්තක / රජත පුස්තක**

සම්මාන අංශය  : නවකතා / කෙටිකතා /යොවුන් නවකතා / කාව්‍ය *(අනවශ්‍ය වචන කතා හරින්න.)*

ග්‍රන්ථයේ නමඃ ..........................................................................................................................................

කර්තෘගේ  නමඃ ..........................................................................................................................................

කර්තෘගේ ලිපිනය : ..........................................................................................................................................

කර්තෘගේ දුරකථන අංකය : ..........................................................................................................................

ප්‍රකාශන ආයතනය : ..........................................................................................................................................

ප්‍රකාශන ආයතනයේ ලිපිනයඃ ..........................................................................................................................

ප්‍රකාශන ආයතනයේ නියෝජිතයාගේ නම සහ දුරකතන අංකය ......................................................................

..........................................................................................................................................................................

ISBN අංකයඃ ..........................................................................................................................................

ග්‍රන්ථය ප්‍රකාශයට පත් කළ වර්ෂය : ..........................................................................................................

රාජ්‍ය ලේඛනාගාරයේ ලියාපදිංචි කළ දිනය : ..........................................................................................

ලියාපදිංචි අංකය : ...........................................................................................................................

ඉහත සඳහන් කෘතිය අප ආයතනය විසින් 2025 වර්ෂය තුළ ප්‍රකාශයට පත් කරන ලද බවත්, එම කෘතිය ස්වර්ණ පුස්තක / රජත පුස්තක සම්මාන (Sri Lanka Book Awards 2026) උළෙල සඳහා සඳහා වන අදාළ සියලු කොන්දේසිවලට සහ විනිශ්චය මණ්ඩලයේ තීරණය අවසන් තීරණය වන බවට එකඟව බව දන්වමින් අයදුම් කරමි.

| | | |
|---|---|---|
| ............................................. | ........................................ | ...................................... |
| නම | අත්සන | දිනය |

*(ආයතනයේ රබර් මුද්‍රාව අනිවාර්ය වේ.)*

**ලේඛකයාගේ අභිලාශය ප්‍රකාශ කිරීම :**

ස්වර්ණ පුස්තක / රජත පුස්තක සම්මාන (Sri Lanka Book Awards 2026) සඳහා ..................................................................... ප්‍රකාශන ආයතනය මගින් ප්‍රකාශිත, මා විසින් රචිත ......................................................... නම් කෘතිය ඉහත සම්මාන උළෙල සඳහා ඉදිරිපත් කිරීමට කැමැත්ත මෙයින් ප්‍රකාශ කරමි.

| | | |
|---|---|---|
| ............................................. | ........................................ | ...................................... |
| නම | අත්සන | දිනය |

*(ලේඛකයා දිවයිනෙන් බැහැර නම් ඒ සඳහා වන අභිලාෂ ලිපියක් වෙනම අමුණන්න.)*

## Sri Lanka Book Awards 2026
ස්වර්ණ පුස්තක සම්මානය /රජත පුස්තක සම්මානය

**නිර්මාණාත්මක ලේඛක ප්‍රජාව දිරිගන්වමින් සිංහල නවකතා, කෙටි කතා, කාව්‍ය සහ යොවුන් කතා කලාවේ හෙට දවස වඩාත් යහපත් කරනු පිණිසත්, ලේඛක, ප්‍රකාශක, පාඨක සම්බන්ධතාවය වැඩි දියුණු කිරීම පිණිසත්, දේශීය පොතපත ජාත්‍යන්තරයට හඳුන්වාදීම උදෙසාත්, ශ්‍රී ලංකා පොත් ප්‍රකාශකයන්ගේ සංගමය ශ්‍රී ලාංකීය සාහිත්‍යවේදීන් උදෙසා පිරිනමන ස්වර්ණ පුස්තක, රජත පුස්තක සම්මානය 2026 සඳහා කෘතින් භාර ගැනීම දැන් සිදු කෙරේ.**

### 01. සම්මාන සහ ත්‍යාග

i. ස්වර්ණ පුස්තක සම්මානලාභියාට සම්මානය සමග රුපියල් හත් ලක්ෂ පනස්දහසක මුදල් ත්‍යාගයක් පිරිනැමේ.

ii. රජත පුස්තක පුස්තක සම්මානලාභීන්ට සම්මානය සමග රුපියල් දෙලක්ෂ පනස්දහසක මුදල් ත්‍යාගයක් පිරිනැමේ.

ii. අවසාන වටයට නිර්දේශිත "ස්වර්ණ පුස්තක" ග්‍රන්ථ පහේ කතුවරුන්ට රුපියල් ලක්ෂයක මුදලක් ප්‍රදානය කෙරේ.

ii. අවසාන වටයට නිර්දේශිත "රජත පුස්තක" ග්‍රන්ථ හතරේ කතුවරුන්ට රුපියල් පනස් දහසක මුදලක් ප්‍රදානය කෙරේ.

### 02. සම්මාන සඳහා ඉදිරිපත් කිරීමට සුදුසුකම් ලබන කෘතින්

i. ශ්‍රී ලාංකිකයෙකු විසින් රචිත, මුල්වරට සිංහලෙන් ලියා 2025 වසර තුළ ප්‍රකාශයට පත් කළ, ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කරන ලද **නවකතා, කෙටි කතා, කාව්‍ය සහ යොවුන් නවකතා** පමණක් භාර ගනු ලැබේ.

ii. ඇගැයීම් මණ්ඩල වෙත ලබා දීම පිණිස "ස්වර්ණ පුස්තක" සම්මාන සඳහා එක් කෘතියකින් පිටපත් 15 ක් ද "රජත පුස්තක" සම්මානය එක් කෘතියකින් පිටපත් 05 බැගින් ලබා දිය යුතු අතර, සෑම කෘතියක් සඳහාම අයදුම්පත් වෙන් වෙන්ව ඉදිරිපත් කළ යුතුය. සාමාජිකයන් නොවන ප්‍රකාශන ආයතන වෙතින් ලියාපදිංචි ගාස්තු වශයෙන් එක් කෘතියක් සඳහා රුපියල් 5000/-ක මුදලක් අය කරන ලැබේ.

iii. ඉදිරිපත් කරන කෘතීන් ලියාපදිංචි ප්‍රකාශන ආයතනයක් මගින් ප්‍රකාශයට පත් කළ කෘතියක් විය යුතු අතර, කර්තෘ ප්‍රකාශන හෝ අදාල කෘතිය ප්‍රකාශයට පත් කිරීම සඳහා පමණක් ලියාපදිංචි කරන ලද ආයතනයක් මගින් ප්‍රකාශිත කෘති භාරගනු නොලැබේ. *(ප්‍රකාශන ආයතනයේ ලියාපදිංචි සහතිකය අමුණන්න.)*

iv. මුල්වරට වෙනත් භාෂාවකින් ප්‍රකාශයට පත්වී සිංහලට පරිවර්තනය කරන ලද කෘති බාර ගනු නොලැබේ.

v. ස්වර්ණ පුස්තක සම්මානය සඳහා ඉදිරිපත් කරන කෘති මුල්වරට පුවත්පත්, රූපවාහිනි, ගුවන් විදුලි සහ සමාජ මාධ්‍යයක කොටස් වශයෙන් පළවී නොතිබිය යුතුය. එවැනි කෘති, අයදුම්පත් බාර ගත් පසුව හෝ සම්මාන උළෙලින් පසුව හෝ නිරාවරණය වුවහොත් සම්මාන උළෙලෙන් ඉවත් කිරීමේ හා සම්මානය නැවත කැඳවීමේ බලය සංගමය සතුය.

vi. ඉහත දක්වා ඇති කොන්දේසිය රජත පුස්තක සඳහා අදල නොවේ.

## 03. කොන්දේසි

i. සම්මානය සඳහා සළකා බැලෙනුයේ ශ්‍රී ලංකා පොත් ප්‍රකාශකයන්ගේ සංගමය මගින් නිකුත් කරන නිල අයදුම්පත සමග ඉදිරිපත් කරන කෘති පමණකි.

ii. අවසාන වටයට නිර්දේශිත ග්‍රන්ථ, නිවේදනය කළ දින සිට දින 14 ක් ඇතුළත නවකතා සඳහා එක් ග්‍රන්ථයකින් පිටපත් පන් දහසක් (5,000) ද, අනෙකුත් කෘති පිටපත් 2000 ද, අළෙවිය සඳහා සූදානම් කිරීමට ප්‍රකාශන ආයතනය එකඟ විය යුතුය.

iii. ඉහත ( ii ) සඳහන් ග්‍රන්ථ සඳහා කෙරෙන සියලු ප්‍රචාරක කටයුතු සඳහා ප්‍රකාශන ආයතනය එකඟතාවය පළ කළ යුතුය. එසේම අවසන් වටයට තෝරා ගන්නා "ස්වර්ණ පුස්තක" කෘති 5 ප්‍රකාශයට පත් කළ පසු එම කෘතිවල ප්‍රකාශකයන් විසින් ප්‍රචාරක සහ පරිපාලන වියදම් වශයෙන් රුපියල් පනස් දහසක මුදලක් (රු,50,000.00) සංගමයට ගෙවිය යුතුය.

iv. ඉහත ( ii ) සඳහන් ග්‍රන්ථ සඳහා කෙරෙන සියලු ප්‍රචාරක කටයුතු සඳහා ප්‍රකාශන ආයතනය එකඟතාවය පළ කළ යුතු අතර, "රජත පුස්තක" අවසන් වටයට තෝරා ගන්නා කෘති 4 ප්‍රකාශයට පත් කළ පසු එම කෘතිවල පිටපත් 10 ක් ප්‍රකාශකයන් විසින් ප්‍රචාරක කටයුතු සඳහා සංගමයට ලබා දිය යුතුය.

v. සම්මාන උළෙලට ලේඛකයා හෝ ලේඛිකාව සහභාගි කරවීමේ වගකීම ප්‍රකාශකයා වෙත පැවරේ.

vi. සියලු අංශ සඳහා විනිශ්චය මණ්ඩලය විසින් ගනු ලබන තීරණ අවසාන තීරණ වන අතර, එම තීරණවලට එකඟ වන බවට ප්‍රකාශන ආයතනය සහ ලේඛකයා සහතික විය යුතුය.

vii. 2023, 2024 සහ 2025 වසරේ සිට සම්මාන ලාභි කෘතිවල ලේඛකයන්ට, නැවත එම සම්මාන කාණ්ඩය සඳහා වසර 03 හෝ සම්මාන උත්සව තුනක් සඳහා කෘති ඉදිරිපත් කළ නොහැක.

viii. 2025 වර්ෂය තුළ ප්‍රකාශිත කෘති, වෙනත් පෞද්ගලික ආයතන මගින් සංවිධානය කරනු ලබන සාහිත්‍ය උත්සවවල තරග කරමින් නිර්දේශ හෝ සම්මාන නොලද කෘති විය යුතුය. එවැනි කෘති මෙම උළෙල සඳහා ඉදිරිපත් කළ නොහැක.

**මෙවර කෘති ඇගැයීම කල්වේලා ඇතිව ආරම්භ කරන නිසා, කෘති භාර ගැනීම අදියර දෙකකින් පැවැත්වේ. ඒ සඳහා, ඔක්තෝබර් 31 වෙනිද දක්වා ප්‍රකාශිත කෘති නොවැම්බර් 30 වෙනිදට පෙරත්, දෙසැම්බර් 31 වෙනිද දක්වා ප්‍රකාශයට පත් කල කෘති 2026 ජනවාරි 10 වැනි දින හෝ ඊට පෙරත්, අංක 83 පාර්ලිමේන්තු පාර, බත්තරමුල්ල පිහිටි පොත් ප්‍රකාශකයන්ගේ සංගමයේ ප්‍රධාන කාර්යාලයට ගෙනැවිත් භාර දිය යුතුය.**

**අයදුම්පත් සඳහා – www.bookpublishers.lk වෙබ් අඩවියට පිවිසෙන්න.**

ස්තුතියි

මෙයට, හිතවත්

**ලසිත උමගිලිය**
**ප්‍රධාන ලේකම් - ශ්‍රී ලංකා පොත් ප්‍රකාශකයන්ගේ සංගමය**